# කැලණිය අධ්‍යාපන කලාපය
## දෙවන වාර පරීක්ෂණය - 2016
## කතෝලික ධර්මය

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම :-....................................................................................

විභාග අංකය :- ..............................................

ශ්‍රේණිය :- 9 ..............                                                  කාලය පැය 2 වි. 30

---

## 1 කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01)

01."ස්වාමිනි රෑ මුළුල්ලේ ම වෙහෙස වූ නමුත් අපි කිසිවක් නොලදිමි. එහෙත් ඔබ කියන සේක් නම් දැල් හෙළමි"යි යනුවෙන් පැවසුවේ,

1) පේදුරු තුමාය.  2) ඇන්ඩෘ තුමාය.  3) පාවුළු තුමාය.  4) ජාකොබ් තුමාය.

02. ශ්‍රාවකයින් යන වචනය සඳහා යොදා ඇති ග්‍රීක නාමය වනුයේ,

1) තියෝෆිලස්  2) මකාරියොයි  3) මතෙටේස්  4) පරුසියා

03. මහනුවර රාජධානියට යාච්ඤා කරමින් වැස්ස ලබා දුන්නේ,

1) ප්‍රැන්සිස් සාවියර් මුනිතුමා  2) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
3) ජුසේවාස් මුනිතුමා  4) ජෝන් විලාද කොන්ද් පියතුමා

04. නාමාන් නමැති සිරියානු ජාතික කුෂ්ට රෝගියා සුවය ලැබුවේ ................... මගිනි.

1) එලියා දිවැසිවරයා  2) එලීෂා දිවැසිවරයා
3) නාතාන් දිවැසිවරයා  4) ආමොස් දිවැසිවරයා

05. "ඔබට ඇදහිල්ල ඇත්නම් ඔබ දෙවියන් වහන්සේගේ තේජශ්‍රීය අත් දකින බව මා කීවා නොවේද"යි යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,

1) අරිමතියාවේ ජෝෂප්ට ය.  2) මග්දලාහි මරියාට ය.
3) තෝමස් අපෝස්තුළුවරයාට ය.  4) ලාසරස්ගේ සොයුරිය වූ මරියාට ය.

06. ......................... නොමැති අවස්ථාවල ජේසුස් වහන්සේ කිසිදු ප්‍රාතිහාර්යයක් නොකළ සේක. හිස්තැනට අදාළ පිළිතුර වනුයේ,

1) ප්‍රේමය  2) විශ්වාසය  3) බලාපොරොත්තුව  4) පරිත්‍යාගය

07. සොබාදහම හා සම්බන්ධ ප්‍රාතිහාර්යයකි. ජේසුස් වහන්සේ .......................

1) මුහුද මත ඇවිදීම.  2) ලාසරස් මරණින් නැගිටුවීම.
3) අංශභාග රෝගීයා සුව කිරීම  4) මීමැස්මොර රෝගියා සුව කිරීම.

08. පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනය ප්‍රකාශ වූ සලකුණු වනුයේ,

1) සුළඟ හා ගින්දර  2) ගින්දර හා කුණාටුව
3) වැස්ස හා සුළඟ  4) තද සුළඟ හා කුණාටුව

09. මුල් ක්‍රිස්තියානි සභාවේ ලක්ෂණයක් නොවන්නේ.
1) රොටි කැඩීම.
2) දේව මාළිගාවේ රැස්වීම.
3) තම ශුභසිද්ධියට වෙහෙසීම.
4) සියල්ල පොදුවේ තබා ගැනීම.

10. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ දී නායකත්වය ගෙන කටයුතු කළේ,
1) ශු. ජාකොබ් තුමා 2) ශු. පේදුරු තුමා 3) ශු. පාවුලු තුමා 4) ශු. ජොහාන් තුමා

11. ශාරීරික පුණ්‍ය ක්‍රියාවක් නොවන්නේ,
1) සාගිනිව සිටින අයට ආහාර දීම.
2) ආගන්තුකයන්ට සත්කාර කිරීම.
3) රෝගීන් වෙනුවෙන් යාච්ඤා කිරීම.
4) සිරගත වී සිටින අය බැලීමට යාම

12. "මරණය තවත් නැත වැලපීම ද, හැඬීම ද වේදනාව ද තවත් නැත." යනුවෙන් සඳහන් වනුයේ ශු. බයිබලයේ කුමන පොතෙහි ද?
1) නික්මයාම 2) එළිදරව්ව පොත 3) ගීතාවලිය පොත 4) දානියෙල්ගේ පොත

13. අළු බදාදා දවසින් ආරම්භ වන්නේ,
1) පාස්කු සමයයි. 2) චතාරික සමයයි. 3) ආගමන සමයයි. 4) උත්ථාන සමයයි.

14. පැරණි ගිවිසුම අසිරිමත් සිද්ධිය වන්නේ,
1) මෝසස් තුමාගේ කැඳවීමයි.
2) දසපණත ලැබීමයි.
3) නික්මයාමයි.
4) පෙන්තකොස්තයයි.

15. "අගපේ" යන ග්‍රීක වචනයේ තේරුම
1) දයා ප්‍රේමය 2) දයානුකම්පාව 3) බෙදාගැනීම 4) පරිත්‍යාගි වීම

16. "ස්වාමිනි මා ඔබගේ සාමයේ උපකරණයක් කළ මැනව" යනුවෙන් දෙවිපියාණන්ගෙන් අයැද සිටියේ,
1) දොමිනික් සාවියෝ මුනිතුමා
2) ජෝන් ක්‍රිසෝස්තම් මුනිතුමා
3) ප්‍රැන්සිස් සාවියර් මුනිතුමා
4) අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමා

17. මුල් කිතුනු සභාව තුළ තිබූ උතුම් මිනිස් වටිනාකම් නූතන ලෝකය වෙත ගෙනයාමට උත්සාහ දරන මීසම තුළ ක්‍රියාත්මක වන වැඩසටහනකි,
1) මරිය හමුදාව
2) පූදසුන් සේවය
3) අසිපා වැඩසටහන
4) වින්සන් ද පාවුලා සංගමය

18. දෙවනි වතිකාන මන්ත්‍රණ සභාවට ශ්‍රී ලංකාවෙන් සහභාගි වූ එකම ගිහියා
1) ගොඩ්වින් මෙන්ඩිස් මහතා
2) ඒ. ඩබ්ලිව් පෙරේරා මහතා
3) ඩබ්ලිව්. එස්. ගෝමිස් මහතා
4) යූ. එස්. ගොඩගේ මහතා

19. "දුව ඔබ රජ පවුලක යන්න අමතක කර දෙවියන් වහන්සේට බැහැපත්කමින් සේවය කරන්න." යන තම මවගේ ඔවදන පිළිගෙන දේව සේවයට කැපවූයේ
1) සිසිලියා තුමිය
2) ඇග්නස් තුමිය
3) මරිය ගොරෙට්ටි තුමිය
4) යුප්‍රේසියා තුමිය

20. පුරාණ පාස්කු යාගය පූර්ණත්වයට පත්වූයේ කෙසේද?
1) ජේසුස් වහන්සේ මාංශගත වීමෙනි.
2) පෙන්තකොස්ත සිද්ධියෙනි.
3) කල්වාරි යාගයෙනි.
4) දස පණත තුළිනි.

02) මෙම ප්‍රකාශයන්ට අදාළ අවස්ථා සම්බන්ධය ලියන්න.

1. "ඔබේ අත දිගු කරන්න."
2. "ඔබේ ඇඳකිල්ල කොතරම් හීනද? සැක කළේ මන්ද?"
3. "අද ඔබ මා සමඟ පාරාදීසයේ සිටින්නෙහි ය."
4. "පාරාවෝ වෙත ගොස් ඉශ්රායෙල් ජනයා මිසරයෙන් පිටතට ගෙනයනු පිණිස මම කවරෙක්ද"යි ඇසීය.
5. "ස්වාමිනි මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි. යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම් ඔහුට සතර ගුණයක් ආපසු දෙමි."

## II කොටස

**ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) 1. පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන් ප්‍රකාශ වූ සලකුණු 2 ලියන්න.
2. මුල් කිතුනු සභාවේ ලක්ෂණ තුනක් ලියන්න.
3. ශු. සභාව මගින් ලෝකයට ඉටුවන සේවාවන් පහක් ලියන්න.

02) 1. ජෙරුසලම් මන්ත්‍රණ සභාව පැවැත්වීමට හේතුව දක්වන්න.
2. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ තීරණ තුනක් දක්වන්න.
3. බහු ආගමික රටක වෙසෙන ඔබගේ වගකීම් පහක් දක්වන්න.

03) 1. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය ලැබීමට පෙර අප සූදානම් විය යුතු ආකාර දෙක දක්වන්න.
2. ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරය ලබාගන්නා අප තුළ දිස්විය යුතු ගුණාංග තුනක් ලියන්න
3. අසිසියේ ප්‍රැන්සිස් තුමන්ගේ සාම යැදුමේ අඩංගු ඉල්ලීම් පහක් දක්වන්න.

04) 1. ජේසුස් වහන්සේ මුණ ගැසීමෙන් ජීවිතය වෙනස් කරගත් පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.
2. යහපත් එඬේරාණන් වන ජේසුස් වහන්සේ තුළ දකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න.
3. එම එඬේරාණන් අනුගමනය කරන ඔබ සතුවිය යුතු ගුණාංග පහක් ලියන්න.

05) 1 ශුද්ධ බයිබලය ලේඛනගත වූ කාලය දක්වන්න.
2 ශුද්ධ බයිබලයේ ත්‍රිවිධාකාර දේවානුභාවය දක්වන්න.
3. ශුද්ධ බයිබලය අධ්‍යයනය කිරීමෙන් ඔබ ලබන ප්‍රයෝජන පහක් ලියන්න.

06) 1. මිදිවැල පිළිබඳ උපමාවේ මිදිවැල හා අතු සමාන කර දක්වන්නේ කවුරුන් හටද?
2. මාටින්ද ජෝන්ස් මුනිතුමා හඳුන්වන වෙනත් නම් තුනක් ලියන්න.
3. මීසම තුළ දිළිඳුනට, අසරණයන්ට පිහිට විය හැකි අවස්ථා පහක් දක්වන්න.

07) 1. පුරාණ ගිවිසුම තුළ දෙවියන් වහන්සේ පොරොන්දු ඉටුකළ අවස්ථා දෙකක් දක්වන්න.
2. සත්‍ය ප්‍රකාශ කිරීම තුලින් අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න.
3. "සත්‍යය අපට සතුට ගෙන දේ" පිළිබඳ පේළි පහකින් විස්තර කරන්න.

08) කැමති මාතෘකා දෙකක් තෝරාගෙන පේළි 8 බැගින් කෙටි සටහන් ලියන්න.
1. යහපත් බැටළු එඬේරාණන්
2. ගොඩ්වින් මෙන්ඩිස් මහතා
3. යුප්‍රේසියා මව්තුමිය
4. මෝසස් තුමාගේ කැඳවීම
5. ජෙරුසලම් මන්ත්‍රණ සභාව